**ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු වාණිජ මණ්ඩලයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී**
**වැඩ බලන එක්සත් ජනපද තානාපති රොබර්ට් හිල්ටන් මහතා විසින් දක්වන අදහස්**
**2017 සැප්තැම්බර් 29**

ඉතාමත් උණුසුම් අන්දමින් මා පිළිගැනීම් පිළිබඳව රවීන් ඔබට ස්තුතියි. ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු වාණිජ මණ්ඩලයේ වාර්ෂික මහාසභා රැස්වීමට නැවත වතාවක් සහභාගීවීමට ලැබීම පිළිබඳව මා ඉතා සතුටට පත්වෙනවා.

මෙම අවස්ථාව සංවිධානය කිරීම පිළිබඳව ඇමෙරිකානු වාණිජ මණ්ඩලයේ අධ්‍යක්ෂකවරුන්ට සහ ඒ වෙනුවෙන් මහත් සේ කැපවී ක්‍රියාකළ රධිකා සහ ඇයගේ කාර්යය මණ්ඩලයට මා ස්තුතිවන්ත වෙනවා. මෙම කාලය තුළදී රධිකා විසින් ඇමෙරිකානු වාණිජ මණ්ඩලය වෙනුවෙන් සුවිශේෂී රාජකාරී ගණනාවක් ඉටු කළා. අපිට ඔබ අහිමි වෙනවා. අපට අහිමි වීම හේලීස් ආයතනයට වාසියක් වෙනවා. එහිදී ද ඇය මේ අන්දමින් කැපීපෙනෙන අයුරින් වැඩකරන බට මට විශ්වාසයි.

ඇමෙරිකානු ව්‍යාපාරික ප්‍රජාව සහ ඇමෙරිකන් සමාගම් සමගින් ව්‍යාපාරික කටයුතු වල යෙදෙන පිරිසද මේ අවස්ථාවේ මා සාදරයෙන් සිහිපත් කරනවා. ඇමෙරිකානු වාණිජ මණ්ඩලය යනු ඔබයි. ඔබ නැත්නම් වාණිජ මණ්ඩලයක් නොමැති වනු ඇත. ඇමෙරිකානු වාණිජ මණ්ඩලයේ අමෙරිකන් සමාගම් වල නියෝජනය වැඩිවීම පිළිබඳව තානාපතිතුමා සහ මම ඉතා සතුටට පත්වෙනවා. ඇමරිකනානු වාණිජ මණ්ඩලය වඩාත් කාර්යක්ෂමව වැඩකිරීම නිසා ඇමෙරිකන් සමාගම් වැඩිවශයෙන් සම්බන්ධවී සිටිනවා. එසේම මෙම වැඩිවූ සම්බන්ධතාවයන් මගින් ඇමෙරිකන් වාණිජ මණ්ඩලයට ලබාගත හැකි ප්‍රතිඵලයද වැඩිවෙනවා.

සාර්ථක ඇමෙරිකානු වාණිජ මණ්ඩලයක පහත සඳහන් ගතිලක්ෂණ තුන ඇති බවට අපි විශ්වාස කරනවා

1. කාර්යක්ෂම අන්දමින් උද්දේශනයේ /අභිදේශනයේ නිරතවීම තම සාමාජිකයින්ට වැදගත් වන ප්‍රශ්න සම්බන්ධයෙන් සාමූහික අධිකාරියකින් යුක්තව හඬනැගීම
2. විවිධත්වයෙන් යුක්ත වීම සමාජයේ සහ ආර්ථිකයේ සියලුම කොටස් නියෝජනයවීම
3. සියලුදෙනා සම්බන්ධවී සිටීම  මෙමගින් පෞද්ගලික අංශයේ පුරවැසිභාවය නංවාසිටීම ඔපවත් කිරීම සිදුකරනු ලබයි

ඵලදායී ඇමෙරිකානු වාණිජ මණ්ඩලයක් නිදහස් සහ සාධාරණ වෙළඳාම, ආචාරධර්මවලට අනුකූල වන ආකාරයට  ව්‍යාපාර සහ රැකියාලබාදීමේ  භාවිතාවන් පිළිපැදීම, විනිවිදභාවය සහ නිදහසේ තොරතුරු ලබාගැනීමේ හැකියාවද ඇතුළත්ව ඇමෙරිකන් සාරධර්ම වෙනුවෙන් පෙනීසිටියි.

මෙම සාරධර්ම වලට  සහ අනෙකුත් මූලික අයිතිවාසිකම් සුරැකීමට නැවත වතාවක් කැපවී ක්‍රියාකිරීම දක්නට ලැබෙන මෙම කාලසීමාව ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතු සිදුකිරීම සඳහා වෙම් සුභ මොහෙතෙක් ලෙස සැලකිය හැකිය. ඇමෙරිකන් සමාගම් මෙහි ව්‍යාපාරික කටයුතු කිරීමට කැමැත්තෙන් සිටින අතර අප දෙරට අතර ද්විපාර්ශවීය වෙළඳාම වැඩිදියුණු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග පිළිබඳව එක්සත් ජනපද රජය අවධානය යොමුකර තිබේ.

සති දෙකකට පෙර ඇමෙරිකානු සහකාර වෙළඳ නියෝජිතයකු වන මාක් ලින්ස්කොට් කොළඹට පැමිණි අතර වෙළඳාම සහ ව්‍යාපාරික වාතාවරණය වැඩිදියුණු කරන්නවූ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා උනන්දු කළේය. වෙළඳ සහ ආයෝජන අවස්ථාව ආකර්ශණය කරගැනීම සඳහා  රජයේ ටෙන්ඩර් ලබාදීමේදී දූෂණය දුරලීම සහ යම් පාර්ශවයන්ට විශේෂ වාසිසැලසෙන අයුරින් පක්ෂපාතීව ක්‍රියාකිරීම මැඩලීමට අවශ්‍ය පියවර ගනිමින් විශ්වාසය තැබිය හැකි ශක්තිමත් හා විනිවිදභාවයෙන් යුත් ආර්ථික ප්‍රතිපත්ති සැකසීමේ අවශ්‍යතාවය ඔහු මෙහිදී අවධාරණය කළේය. එසේම දේශිය සහ විදේශ ව්‍යාපාරවලට බාධාවක්ව පවත්නා තීරුබදු සමහරක් ඉවත් කිරීමේ අවශ්‍යතාවයද ඔහු පෙන්වා දුන්නේය.

බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට පියවර ගන්නා ලෙසටද ලෝක වෙළඳ සංවිධානයේ තාක්ෂණික ගිවිසුමට හෝ ITA හා සම්බන්ධවෙමින් දේශීය වශයෙන් පවත්නා තරගකාරිත්වය වර්ධනය කරගැනීමට පියවර ගන්නා ලෙස ඔහු ඉල්ලා සිටියේය. මේ සමගම මාක් ක්ෂුද්‍ර මට්ටමේ පවත්නා ගැටලු පිළිබඳවද තම අවධානය යොමු කළේය. දැනට ක්‍රියාත්මක කරනු ලබන වසරක කාලයක සඳහා පමණක් නේවාසික වීසා ලබාදීමේ පිළිවෙත විදේශ ආයෝජන පැමිනීමට බාධාවක් වන ආකාරය ඔහු පෙන්වා දුන්නේය. නේවාසික විසා ලබාදීමේ කාලසීමාව වසර තුන දක්වා වැඩි කිරීමට ශ්‍රී ලංකා රජය ක්‍රියාකරන බවට අපට දැනගන්නට ලැබී ඇති අතර ඔබට මෙය සුභාරංචියක් වන බවට මට විශ්වාසයි.

එක්සත් ජනපද රජය සහ ඇමෙරිකානු වාණිජ මණ්ඩලය විසින් සිදුකරනු ලබන ඉල්ලීම් වලට අනුව ශ්‍රී ලංකාවේ රජය මෙවැනි ධනාත්මක පියවර ගන්නා විට එක්සත් ජනපද සමාගම් නිරායාසයෙන්ම ශ්‍රී ලංකාවට සංක්‍රමණය වනු ඇත. ඔවුන් මෙසේ කරන විට ශ්‍රී ලංකාවට ගුණාත්මක වශයෙන් ඉහළ එක්සත් ජනපද භාණ්ඩ ආනයනය කිරීමට හැකිවනු ඇත. වර්තමානයේදී ශ්‍රී ලංකාව වසරකට ඇ එ ජ ඩොලර් බිලියන 2.8 ක් වටිනා භාණ්ඩ එක්සත් ජනපදයට අපනයනය කරන අතර එක්සත් ජනපදයෙන් ශ්‍රී ලංකාව ආනයනය කරනු ලබන්නේ මිලියන 269 වටිනා භාණ්ඩ පමණි. අප දෙරටේම සුභසිද්ධිය සඳහා මෙම විශාල වෙළඳ පරතරය/හිඟය නිමා කිරීමට කටයුතු කළ යුතුයි. තානාපති කාර්යාලය අඛණ්ඩවම USTR, ශ්‍රී ලංකා රජය සහ ව්‍යාපාරික ප්‍රජාව සමගින් සම්බන්ධවී මෙම ගැටලුව විසඳීම සඳහා කටයුත කරනු ඇත.

අපගේ වැඩකටයුතු, අප පොදුවේ සිදුකරනු ලබන කාර්යයන් මහත් අභියෝගාත්මක ඒවා වූවත් අපි සියලු දෙනාම එක්වී වඩාත් අන්තරකරණයවූ, සාධාරණ සාමකාමී සහ වඩාත් සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් ගොඩගැනීම සඳහා කැපවී ක්‍රියාකරන්නෙමු. මෙම දුෂ්කර ප්‍රයත්නයන් මගින් එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව වඩාත් සමීප මිතුරන් බවට පත්වී අපගේ ව්‍යාපාරික කටයුතු තවදුරටත් වර්ධනය කරගනු ඇත. මෙමගින් අපි සියලු දෙනා ප්‍රතිලාභ අත්කර ගනු ඇත. ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය අතර මිතුරුකම සහ පාර්ශවකරනය වර්ධනය කිරීමට කැපවී ක්‍රියාකරන ඔබ සැමට ස්තුතියි.